**නිහාල් ශ්‍රී අමරසේකර** වරලත් ගණකාධිකාරි, වරලත් කළමණාකරණ ගණකාධිකාරි
ව්‍යාපාර සහ කළමනාකරණ උපදේශක

167/4, විපුලසේන මාවත
කොළඹ 10.
දුරකතන - 2686364 / 2696814

<u>ඉංග්‍රීසි බසින් යැවූ ලිපියේ පරිවර්ථනය</u>

2007 දෙසැම්බර් 10

<u>ෆැක්ස් / කුරියර් සේවය මගින්.</u>

<u>වැදගත්</u>

ගරු ඩබ්ලිව්.ජේ.එම්.ලොකුබණ්ඩාර මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී,
පාර්ලිමේන්තුවේ කථානයක,
පාර්ලිමේන්තු සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
<u>කෝට්ටේ.</u>

ගරු කථානායකතුමනි,

<u>2007 විසර්ජන කෙටුම්පත.</u>

2007.10.10 දින පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුලත් වූ, 2007 විසර්ජන කෙටුම්පත සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අංක. 121 පරිදි, ඔබතුමාටද පිටපතක් සහිතව, මා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කල බව ඔබතුමා දන්නා බැවින්, එම තත්වය යටතේ, පහත සඳහන් කරුණු ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කරමි.

ඉන් අනතුරුව තවත් පාර්ශවයන් කිහිපයක් විසින් ද, පෙත්සම් ඉදිරිපත් කරන ලදුව, ප්‍රස්තුත කාරණය 2007.10.17 දින ඇසීමට ගන්නා ලද බවද ඔබතුමා දන්නෙහි ය. අධිකරණය ඉදිරියේ පුද්ගලිකව පෙනී සිටි මා හට, අධිකරණ සම්ප්‍රදායික චාරිත්‍ර ප්‍රකාරව, අධිකරණය ආමන්ත්‍රණය කිරීමට හැකිවූයේ අන්තිමටම, සවස 3.00 ත් ඉක්මවා ගිය, අධිකරණ කටයුතු අවසන් කිරීමට ආසන්න කාලයේ බැවින්, ඉතිරි වූ කෙටි කාලයතුළ මා හට අවකාශ ලැබුනේ 2003 අංක. 3 දරණ "රාජ්‍ය මුදල් කළමණාකරණ (වගකීම)" පනතේ විධිවිධානය ගැන අවධානය යොමු කරවීමට පමණක්වූ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පිළිබඳව යථා පරිදි සැලකිල්ලට ගෙන, අදාල නිශ්චය ඔබතුමා වෙත ලැබෙන්නට සලස්වා ඇත. <u>රාජ්‍ය මුදල් පරිහරණය පිළිබඳව පිරික්සීමට සහ ඇගයීමට මහජනතාවට අවස්ථාව ලැබෙන අයුරින්, තොරතුරු විනිවිද දැකිය හැකියේ හෙළිකිරීමට, 2003 අංක.03 දරණ පනත මගින් විධානය කර ඇත.</u>

ශ්‍රේෂ්ඨාධිකරණ නිශ්චයේ පහත සඳහන් 'ප්‍රකාශයන්' කෙරෙහි මම ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරමි.

> "භාණ්ඩාගාර ලේකම්වරයාට 06 වන වගන්තිය යටතේ මුදල් පැවරීම් කළහැක්කේ "සංවර්ධන කටයුතු" (ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව - 2 වැනි වැඩසටහන) වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය මත බැවින් රාජ්‍ය මුදල් කෙරෙහි පාර්ලිමේන්තුව සතු පාලන බලය අත්හැර දැමීමක් සිදු නොවන බව අතිරේක සොලිසිටර් ජනරාල්වරයා සැලකර සිටියේය. අදාල වැඩ සටහන් සඳහා අයවැයෙන් වෙන්කල වැය ප්‍රමාණය සුවිශේෂ ලෙස සලකා බැලීමෙන් අනතුරුව ස්ථාවර නියෝග 131 පරිදි මුදල් සම්මත කෙරෙන බව ඔහු ප්‍රකාශ කළේ ය. 'සංවර්ධන කටයුතු' වැඩ සටහන යටතේ දැක්වෙන මුදල් අනුමත කළයුතු ද යන්න පමණක් නොව, එම වැඩ සටහන යටතේ ඇති මුදල් ප්‍රධාන වගන්තිය පරිදි වෙනත් ශීර්ෂයක වෙනත් වැඩ සටහනකට පැවරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට බලය ඇති බවද, ස්ථාවර නියෝග පරිදි මුළු පාර්ලිමේන්තුවේම කමිටුවක් මගින් සැලකිල්ල යොමුකිරීමද, සාකච්ඡාවට භාජනය කිරීමද, එසේ කිරීමේ දී සිදු කෙරෙනු ඇත.

> භාණ්ඩාගාරයේ ලේකම්වරයාට අභිමතය පිළිබඳ බලය පාර්ලිමේන්තුව විසින් පවරනු ලබන්නේ යථා සහ යෝග්‍ය ලෙස කරුණු සලකා බැලීමෙන් පසුව පමණක් වන බැවින්, එසේ කිරීම රාජ්‍ය මුදල් පිළිබඳව පාර්ලිමේන්තුව සතු පාලන බලය පෙන්සම්කරුවන් තර්ක කරන අන්දමේ අත්හැර දැමීමකට සමකළ නොහැකි බවටත්, මෙම පදනම යටතේ සැලකර සිටින ලදී.
>
> කෙසේවෙතත් භාණ්ඩාගාරයේ ලේකම් විසින් එසේ මාරුකරනු ලබන මුදල් යොදාගනු ලබන්නේ විසර්ජන පනතේ එවිටමත් අඩංගු කර තිබූ වෙනත් යම් ශීර්ෂයක වෙනත් යම් වැඩ සටහනකට බව ද තවදුරටත් සැලකර සිටින ලදී."

මේ සම්බන්ධයෙන් මා ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර සිටින්නේ මෙයට යාකළ 2007 නොවැම්බරයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද '2008 - රාජ්‍ය මූල්‍ය කළමණාකරණ වාර්තාවේ' පිටු කෙරෙහි ය. එම පිටු අතර ඇති 2007.01.01 සිට 2007.10.15 යන කාලය තුළ භාණ්ඩාගාරයේ ලේකම් විසින් 2006 අංක. 47 දරණ විසර්ජන පනතේ 06 වැනි වගන්තිය යටතේ කරන ලද ගෙවීම් පෙන්වන උපලේඛණයක් ඇති අතර, එම ගෙවීම් "කල්වේලා ඇතිව හඳුනාගත නොහැකි අවශ්‍යතා" සඳහා යයි විස්තර කර ඇත. ඉහත කරුණට අදාලව විමසා බලන කල්හි, එතරම් ගෙවීම් ගණනාවක් එවැනි පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් සඳහා කර ඇත්තේ "කල්වේලා ඇතිව හඳුනාගත නොහැකි අවශ්‍යතා" වෙනුවෙන් නම්, සමස්ථ 'අයවැය ක්‍රියාවලියේම' 'විශ්වාසනීයභාවය' ප්‍රශ්ණයට ලක් නොවන්නේ ද?

එපමණක් ද නොව, "මුදල් යොදාගනු ලබන්නේ විසර්ජන පනතේ එවිටමත් අඩංගු කර තිබූ වෙනෙත් යම් ශීර්ෂයක වෙනත් යම් වැඩ සටහනක වියදම් පියවීම සඳහා ..... අදාළ වැඩ සටහන් සඳහා අයවැයෙන් වෙන්කළ වැය ප්‍රමාණය සුවිශේෂ ලෙස සලකා බැලීමෙන් අනතුරුව ස්ථාවර නියෝග 131 පරිදි මුදල් සම්මත කෙරෙන බවටත්" අතිරේක සොලිසිටර් ජනරාල්වරයා කර ඇති සැලකිරීම්වලට, එකී මුදල් ගෙවන ලද්දේ "කල්වේලා ඇතිව හඳුනාගත නොහැකි අවශ්‍යතා" වියදම් සඳහා යැයි කර ඇති පිළිගැනීම, පටහැනි නොවන්නේ ද?

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 149 හා 150 ව්‍යවස්ථා ප්‍රතිපාදනයන් ප්‍රකාරව, පාර්ලිමේන්තුව විසින් "නියමිත කාර්යයන්" වෙනුවෙන් සහ "නියමිත සේවාවන්" සඳහා වෙන් නොකරන ලද මුදල් "ඒකාබද්ධ අරමුදල" නිර්මාණය වේ.

මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ පහත සඳහන් ප්‍රකාශයන් උපුටා දක්වමි.

> "පරිපූරක ඇස්තමේන්තු වශයෙන් 06 වැනි වගන්තිය යටතේ කරන ලද පරිපූරක ඇස්තමේන්තු ලෙස සැලකෙන පැවරුම් 2003 අංක. 3 දරණ මූල්‍ය කළමණාකරණ (වගකීම පනතේ විධිවිධාන ප්‍රකාරව, ඉදිරිපත් කරන අදාළ වාර්ථාවන් හි නියමිත ලෙස, හා වෙනස් අයුරින් කටයුතු කිරීමට හේතුවූ කරුණු ඒ සමඟ දක්වා, ඇතුලත් වියයුතු බවද, එල්ලවී ඇති දැඩි විවේචන සැලකිල්ලට ගනිමින්, විනිවිදභාවය හා විචක්ෂණයෙන්යුත් මූල්‍ය කළමණාකරණය සහතික කළයුතු බව, අපට ප්‍රකාශ කිරීමට සිදුවී ඇත."
>
> "එසේ වුවද, අපට පෙනී යන්නේ ඉදිරිපත් කරන ලද වාර්ථාවල, ඉකුත් විසර්ජන පනත්වල 5(3) හෝ 6 වගන්ති ප්‍රකාරව ලේකම් විසින් කරන ලද පැවරුම් පිළිබඳව නිශ්චිත සඳහන්, නොතිබූ බවය."

ඉහත සඳහන් ප්‍රකාශ අදාළ වන්නේ 2006 වාර්ෂික වාර්තාවටය. එකී වාර්ෂික වාර්තාව ගුණදොස් දැක්වීමකින් තොරව, කුතුහලයට තුඩු දෙන අයුරින් විගණනය කර සහතික කර ඇත්තේ, මුලු 2006 වසර පුරාම පාහේ රජයේ ගිණුම් අධ්‍යක්ෂක ජනරාල් තනතුර දැරුවාවූ ද, එකී ගිණුම්වලටම වගකිවයුතු වූද, <u>එකම පුද්ගලයා විසින්</u> වීම විශ්මය ජනකය! මෙයට කිසිසෙත්ම අවසර දිය නොහැක! අතිශ් වැදගත් කරුණ නම්, 2006 ගිණුම් සහතික කිරීමේ දී, 2006 ජූලි මාසයේ දී හිටපු විගණකාධිපති විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විශේෂ විගණන වාර්තාවද, සැලකිල්ලට ගෙන නොතිබීමය!

රාජ්‍ය ගිණුම් කමිටු (PAC) සහ පොදු ව්‍යාපාර පිළිබඳව පාර්ලිමේන්තු කාරක සභා (COPE) කමිටු කාර්යාලයේ වාර්තමාන ව්‍යාපෘති අධ්‍යක්ෂක වන, හිටපු විගණකාධිපතිවරයා, 2006 වාර්ෂික වාර්තාව පිළිබඳව, 2007 සැප්තැම්බර් වාර්තාවේ මෙසේ ප්‍රකාශ කර ඇත:

> "අප පාර්ලිමේන්තුවෙන් අනුමත අය වැයත්, ඇත්තවශයෙන්ම දරණ ලද අය වැයත්, අතර ඇති අති විශාල පරතරය, එවැනි වෙනස්වීම් පිළිබඳව පාර්ලිමේන්තුවේ විශේෂ අනුමැතිය හෝ බලය ලබා නොගැනීමේ ක්‍රියාවලිය නිසා, මෙම තත්වය වඩාත් උග්‍ර අතට යොමු වී ඇත.
>
> මෙම වාර්තාවේ දෙවෙනි කොටසේ දෙවනි ජේදයේ විස්තරාත්මකව පැහැදිලි කර ඇති පරිදි, 2006 වසර සඳහා පාර්ලිමේන්තුව සම්මත කළ වියදම, නිළධාරි අභිමතය පරිදි රු. බිලියන 220.2 කින් ප්‍රතිශෝධනය කිරීම උදාහරණයක් ලෙස දැක්විය හැකිය.
>
> 2005 අංක. 39 දරණ විසර්ජන පනතේ 5 වැනි වගන්තියේ ප්‍රතිපාදන මත, එම පනතේ 6 වැනි වගන්තියේ ලත් බලය යටතේ රු. බිලියන 166 කින්ද ඇතුළුව, නිළධාරින්ගේ අභිමතය පරිදි රු.බිලියන 220.2 කින්, වැය මුදල් ප්‍රතිශෝධනය කිරීමෙන් උද්ගතවන ප්‍රශ්ණය වන්නේ, එම ක්‍රියාව, රාජ්‍ය මුදල් පාලනය පිළිබඳව, 148 වැනි ව්‍යවස්ථාවෙන් පර්ලිමේන්තුවට පවරා ඇති පූර්ණ පාලන බලය කොටසක් අගතිකාමී ලෙස අත්හැරීමකට තුඩු දී ඇතිද යන්නය.
>
> 2006 වසර සඳහා වැය වශයෙන් මූලින් අනුමත කරන ලද රු. බිලියන 609 මුදල, ඇත්තවශයෙන්ම වැයකළ මුදල ලෙස ප්‍රකාශිත රු. බිලයන 1072.8 මුදල, සමඟ සැසඳීමේ දී, එකී රු. බිලියන 220.2 මුදල, ඉතා ඉහළ ප්‍රතිශතයක් පිළිබිඹු කරයි.
>
> නිළධාරින්ගේ අභිමතයට ඉඩ හැරීමේ මෙම ක්‍රමය සකස්වී ඇත්තේ පර්ලිමේන්තුවේ හෝ අමාත්‍ය මණ්ඩලයේ හෝ පමණක් නොව, අමාත්‍යාවරයාගේ වත් අනුමැතිය හෝ අවසරය අවශ්‍ය නොවන අන්දමකට බැවින්, තත්වය වඩාත් බරපතල වී ඇත."

ශ්‍රේෂ්ඨාධිකරණ නිශ්චයේ පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි ද, මම ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරමි.

> "වෙනත් ශීර්ෂයන් හා වැඩසටහන් යටතේ එන අනපේක්ෂිත වියදම් පියවීමේ ක්ෂණික වගකීම අවසානයේ දී දරනු ලබන්නේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවයි. මේ සම්බන්ධයෙන් සාපේක්ෂ ලෙස විශාල මුදලක් 'ජාතික අයවැය දෙපාර්තමේන්තු' ශීර්ෂයට වෙන් කිරීමත්, ඒ අනුව සෙසු ශීර්ෂයන්ගේ කොටස් අඩු කිරීමත්, ඇතැම්විට අයවැය පියවීම සඳහා අමාත්‍යවරයා විසින් ඒවා තවත් කප්පාදු කිරීමත්, 2003 වසරේ සිට අනුගමනය කරන අයවැය විධි ක්‍රමයකි. එසේ කරනු ලබන්නේ වෙනත් ශීර්ෂයන් යටතේ හදිසි සහ ක්ෂණික අතිරික්ත වියදම් ඇතිවූ විට ඒවා පියවීමට අවශ්‍ය ප්‍රතිපාදන 'අයවැය දෙපාර්තමේන්තුව' ශීර්ෂයෙන් පවරාදීමේ කල්පිත පදනම මතය. යුද්ධය නිසා ඉහළ යන ආරක්ෂක වැය ද, සීඝයෙන් වැඩිවන තෙල් මිල ද, උද්ධමනයද, වෙනත් රටවල මුදල්වලට සාපේක්ෂව රුපියලේ අගය පහළයාමෙන් උද්ගතව ඇති අසතුටුදායක ගෙවීම් ශේෂය ද, යන සාධක මත රටේ මූල්‍ය තත්වය පත්වී ඇති අස්ථාවරභාවය නිසා, එවැනි ක්‍රියාමාර්ගයන් අවශ්‍යවනබව, අතිරේක සොලිසිටර් ජනරාල් වරයා විසින් කරන ලද සැලකිරීමය.
>
> 2003 වසරේ සිට පාර්ලිමේන්තුව විසින් නොකඩවා නීති වගන්ති සම්මත කර ඇති එකම ස්වභාවය සම්බන්ධයෙන්, අපට අතිරේක සොලිසිටර් ජනරාල්වරයාගේ කරුණු දැක්වීම පිළිගැනීමට අපට සිදුවේ. අස්ථාවර තත්වය යටතේ පරිපූරක ඇස්තමේන්තුවක් වෙනුවෙන් අවශ්‍ය කාලය සහ අවකාශ නොලැබීමට ඉඩ ඇත. එසේ වුවහොත් රාජ්‍ය යන්ත්‍රය නතරවීමට ඉඩ ඇත. ඒ අනුව, අවධාරණය කර ඇති අයුරු, යම් ප්‍රමාණයක නම්‍යතාවයක් අවශ්‍ය වනු ඇත. 151 ව්‍යවස්ථාවෙන් අපේක්ෂාකරන පරිදි "අවනිශ්චිත අවස්ථා අරමුදලක්" පිහිටුවීම මගින් හදිසි සහ අනපේක්ෂිත වියදම් පියවා ගැනීම කෙරෙහි වත්මන් රාජ්‍ය මූල්‍ය තත්වය යටතේ කළ නොහැකි බවට අතිරේක සොලිසිටර් ජනරාල්වරයා ඉදිරිපත් කළ කරුණු සමඟ ද, එකඟවීමට අපට සිදුවන්නේ සරල ලෙස සම්පත් ඌනතාවය නිසා ය."

මේ සම්බන්ධයෙන් 151 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, මම ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරමි:

151 (1) ව්‍යවස්ථාව "149 වන ව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් ඇතත්, අනපේක්ෂිත හදිසි වියදම් සඳහා මුදල් සැපයීම පිණිස අවිනිශ්චිත අවස්ථා අරමුදලක් නීතියෙන් පිහිටුවීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේ ය."

151 (2) ව්‍යවස්ථාව "(අ) අනපේක්ෂිත හදිසි වියදමක් දැරීම අවශ්‍ය බව ද
(ආ) එවැනි යම්කිසි වියදමක් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බව ද

මුදල් විෂයය භාර අමාත්‍යවරයාට අවබෝධ වූවහොත් ජනාධිපතිවරයාගේ කැමැත්ත ඇතිව අවිනිශ්චිත අවස්ථා අරමුදලෙන් අත්තිකාරම් මුදලක් ගෙවීමෙන් ඒ වියදමට අවශ්‍ය මුදල සැපයීමට නියෝග කිරීමේ බලය මුදල් විෂයය භාර අමාත්‍යවරයාට ඇත්තේ ය."

151 (3) ව්‍යවස්ථාව. "අත්තිකාරම් වශයෙන් එවැනි මුදලක් දුන් සෑම අවස්ථාවකම ඒ මුදල ආපසු ගෙවීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් අප්‍රමාදව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේය."

"අස්ථාවර තත්වය යටතේ පරිපූරක ඇස්තමේන්තුවක් වෙනුවෙන් අවශ්‍ය කාලය සහ අවකාශ නොලැබීමට ඉඩ ඇත. එසේ වූවහොත් රාජ්‍ය යන්ත්‍රය නතරවීමට ඉඩ ඇත", යන නිරීක්ෂණය අනුව පැහැදිලි වන්නේ, "අනපෙක්ෂිත හදිසි වියදම්" දැරීමට පෙර, පරිපූරක ඇස්තමේන්තු සම්මත කළ යුතු යයි, ශ්‍රේෂ්ඨාධිකරණයට විශ්වාස කිරීමට, අතිරේක සොලිසිටර් ජනරාල්වරයාගේ සැලකිරීම් මගින් සිදුකර ඇති බව, ඔබතුමාට පෙනී යනවා ඇත.

151 ව්‍යවස්ථාව පරිදි 'අනපේක්ෂිත හදිසි වියදම්' වෙනුවෙන්, කිසිම සීමාවකින් තොරව ගෙවීමටත්, ඉන්පසු අප්‍රමාදව පාර්ලිමේන්තුවට පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියමකර ඇති බැවින්, ව්‍යවස්ථාමය තත්ත්වය, ඉහතකී තත්වය නොවන බව, ඔබතුමාට පැහැදිලි වනු ඇත.

රාජ්‍ය ගිණුම් අධ්‍යයනය කළ විට හෙළිවන්නේ, 'අවනිශ්චිත අවස්ථා අරමුදල' හුදෙක් සංකල්පයක් පමණක් බවත්, ඒ සඳහා යෙදවූ මුදල් සහිත විශේෂිත 'අරමුදලක්' නොමැති බවත් ය. අතිරේක සොලිසිටර් ජනරාල්වරයාගේ සැලකිරීම්වල මතුකළ 'සම්පත් ඌනතාවය' කෙසේවත් පැන නොනගින්නේ, 'අනපේක්ෂිත හදිසි වියදම්' වෙනුවෙන් අනිවාර්යයෙන්ම මුදල් ගෙවනු ලබන බැවිනි. ප්‍රායෝගිකව බැලීමේ දී "අවනිශ්චිත අවස්ථා අරමුදල' හුදෙක් පරිපාලන අංගයක් වන අතර, "අනපේක්ෂිත හදිසි වියදම්" වෙනුවෙන් මුදල් ගෙවීමටත්, ඉන්පසු අප්‍රමාදව පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, 151 ව්‍යවස්ථාව මගින් ඉඩ ප්‍රස්ථා සලසා ඇත.

"සාපේක්ෂ ලෙස විශාල මුදලක් 'ජාතික අයවැය දෙපාර්තමේන්තු' ශීර්ෂයට වෙන් කිරීමත්, ...... එසේ කරනු ලබන්නේ වෙනත් ශීර්ෂයන් යටතේ හදිසි සහ ක්ෂණික අතිරික්ත වියදම් ඇතිවූ විට ඒවා පියවීමට අවශ්‍ය ප්‍රතිපාදන 'අයවැය දෙපාර්තමේන්තුව' ශීර්ෂයෙන් පවරාදීමේ කල්පිත පදනම මතය" යනු අතිරේක සොලිසිටර් ජනරාල්වරයා කර ඇති සැලකිරීම් "සම්පත් ඌනතාවය" යන එතුමාගේම තර්කය සමග නිරායාසයෙන්ම පරස්පර විරෝධී වේ. පිළිගෙන ඇති පරිදි මෙය වෙනත් නමකින් දැක්වෙන "අවනිශ්චිත අවස්ථා අරමුදල්න්" වන අතර, එබැවින් එය 151 ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් වේ. තවද "අතිකුත් වැය ශීර්ෂයන් යටතේ හදිසි සහ ක්ෂණික අතිරික්ත වියදම්" යනුවෙන් සැලකරසිටීම, එවැනි 'නියමිත' වියදම් විසර්ජන පනතේ නියමයන් අනුව පාර්ලිමේන්තුව විසින් අනුමත කර නොමැති බව නිරායාසයෙන්ම පිළිගැනීමකි. "මුදල් යොදාගනු ලබන්නේ විසර්ජන පනතේ එවිටමත් අඩංගු කර තිබූ වෙනත් යම් ශීර්ෂයක වෙනත් යම් වැඩ සටහනකට බව ද" යනුවෙන් කලින් සැලකර සිටීමට ද පරස්පරයකි.

යමෙකුට මේගැන අතිරේක සොලිසිටර් ජනරාල්වරයාට දෝෂාරෝපණය කළ නොහැක. ඒ මන්දයත්, ඔහු විසින් සැලකිරීම් ඉදිරිපත් කරන ලද්දේ මහභාණ්ඩාගාරයෙන් ලද උපදෙස් ප්‍රකාරව වියහැකි බැවිනි.

149 සහ 150 ව්‍යවස්ථා යටතේ පාර්ලිමේන්තුව විසින් "නියමිත කාර්යන්" සඳහා සහ "නියමිත සේවාවක් සඳහා මුදල් වෙන්කර නැත්නම්, එවිට 151 ව්‍යවස්ථාව පරිදි "අනපේක්ෂිත හදිසි වියදම්" වෙනුවෙන් මුදල් පියවීමටත්, ඉන් __අනතුරුව__ අප්‍රමාදව පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, හැකියාව ඇත. 149 සහ 150 ව්‍යවස්ථා පරිදි "නියමිත කාර්යන්" සඳහා සහ "නියමිත සේවාවන්" සඳහා වෙන් නොකළ මුදල් "ඒකාබද්ධ අරමුදල්" ලෙස නිර්මාණය වේ.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි ඔබතුමාගේ පරම කාර්යභාරය සහ වගකීම වන්නේ, එම ව්‍යවස්ථා නියමයන් පරිදි, පාර්ලිමේන්තු කටයුතු පවත්වාගැනීම වන බැවින්, "අනපේක්ෂිත හදිසි වියදම්", 151 ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන පරිදි, පරිපූරක ඇස්තමේන්තු මඟින් පාර්ලිමේන්තුවට __අප්‍රමාදව__ වාර්ථාකිරීමේ වගකීම සහතික කිරීම සඳහා, දේශපාලන පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කර, අවශ්‍ය පියවර ගන්නාමෙන්, මම ඉල්ලා සිටිමි: පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන් දිවුරුමකින් හෝ ප්‍රතිඥවකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කිරීමට බැඳි සිටිති.

"පරීක්ෂා සහ තුලණ" පිළිබඳ නියමයන් ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 151(2) හි - __"මුදල් විෂයභාර අමාත්‍යවරයා සෑහීමට පත්වන්නේනම්__, එතුමා __ජනාධිපතිතුමාගේ එකඟතාවය ඇතිව__ "අනපේක්ෂිත හදිසි වියදම්" සඳහා ප්‍රතිපාදන ලබාදීමට අනුමැතිය දෙනු ඇත. ඒ අනුව, __ජනාධිපතිතුමාම මුදල් අමාත්‍යවරයා වන කල්හි__, 'රාජ්‍ය මුදල් කළමණාකරණයේදී විනිවිදභාවය සහ වගකිවයුතු බව' සහතික කිරීම සඳහා ද, 'රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුවන්නේය" යන 148 ව්‍යවස්ථාව සහ 42 ව්‍යවස්ථාව එකට කියවීමේ දී, ගම්‍ය වන අවශ්‍යතාවය සහතික කිරීම සඳහා ද, 151 ව්‍යවස්ථාව පරිදි, "අනපේක්ෂිත හදිසි වියදම්", පරිපූරක ඇස්තමේන්තු මඟින්, පාර්ලිමේන්තුවට අප්‍රමාදව වාර්ථා කිරීම, අනිවාර්යයෙන්ම වැදගත් වන වගකීමක් නොවන්නේ ද?

"විනිවිදභාවයත්, විචක්ෂණ මුදල් කළමණාකරණයත්," සහතික කිරීමේ වගකීම පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය නිරීක්ෂණය කළේ, 2006 වසර සඳහා 'අනපේක්ෂිත හදිසි වියදම්' වෙනුවෙන් එවැනි හෙළිකිරීමක් කර නොමැති බවයි.

ශ්‍රී ලංකාවද අත්සන් තබා ඇති, එක්සත් ජාතීන්ගේ 'දූෂණයට එරෙහි සම්මුතියේ', අන් කරුණු අතර, වඩාත් විශේෂයෙන් එහි 9 සහ 10 ව්‍යවස්ථාවල සඳහන් වෙන, රාජ්‍ය මුදල් කළමණාකරණයේ දී තිබිය යුතු විනිවිදභාවය සහ වගකිවයුතු බව පිළිබඳ බැඳීම කෙරෙහි, ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකරනු ලබන්නේ, විශේෂයෙන් ම 'ජාත්‍යන්තර දූෂණ විරෝධතා දිනය' ඊයේම යෙදී තිබීමය. මේ සම්බන්ධයෙන් විදේශ ඇමතිතුමාගෙන් විමසා සිටිය හැකිය. 'ව්‍යාප්ත ලෙස සහ ඉහළ මට්ටමක' දූෂණය පවතින බව පිළිගනිමින් ද, සෑම රාජ්‍ය ක්‍රියාවලියකම යහපාලනය සහ විනිවිදභාවය තිබීමේ අවශ්‍යතාවය තහවුරු කරමින්, ජනාධිපතිතුමා සහ විපක්ෂනායකතුමා, ඊයේ පණිවුඩ නිකුත් කර තිබුණි.

අයවැය කථාවේ II කොටසේ II ඇමුණුම ප්‍රකාරව, 'මහජනයාට නවත් බර පටවමින්' ශුද්ධ ආදායම 2008 දී රුපියල් බිලියන 24.9 කින් වැඩිකිරීම සඳහා, ආදායම් යෝජනා 21ක් විය. ඊට වඩා ඉහළ මට්ටමක මුදල්, රජයටත්, මහජනතාවටත්, නැතිවීමෙන් බේරාදීමට, මා මීට පෙර අවස්ථා කීපයකදී ම, ජාතික සහ මහජන අභිවෘද්දිය සඳහා ක්‍රියාකර ඇති බව ඔබතුමා දන්නේහිය.

තවද, අතිගරු අගවිනිසුරුතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අංක. FR10/07 13/07 පෙත්සම් වලදී, ප්‍රකාශයට පත් කරන ලද තීන්දුවේ, පහත ඇති 'ප්‍රකාශයන්' උපුටා දක්වමි.

> " VI පරිච්ඡේදයේ අඩංගු රජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්ම සහ මූලික යුතුකම් විනිශ්චයට භාජනය කළ නොහැකිය යනුවෙන් ප්‍රකාශ කෙරෙන 29 වන ව්‍යවස්ථාවේ සීමා කිරීම, ව්‍යවස්ථාවේ අනිකුත් විධිවිධානයන් අර්ථකතනය කිරීම සඳහා එම විධිවිධානයන් භාවිතා කිරීමට විරුද්ධව බාධකයක් නොවන බව මාගේ මතයයි. VI පරිච්ඡේදයේ 27 වන ව්‍යවස්ථාවේ අඩංගුව ඇත්තේ, එහි ඇතුළත් "රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම", "ධර්මිෂ්ඨ නිවහල' සමාජයක් ඇති කිරීම සඳහා නීති පැනවීමේහිදී ශ්‍රී ලංකාවේහි රාජ්‍යානුශාසනයෙහිදිද, පාර්ලිමේන්තුව, ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් ගරු කොට ගනු ලබන්නේය යනුවෙනි". එම නිසා, 29 වන ව්‍යවස්ථාවේ අගට එකතු කර ඇති සීමා කිරීම, රජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්ම සහ මූලික යුතුකම්හි අඩංගු උතුම් අපේක්ෂාවන් හා අරමුණු වලින් බැහැර වීමක් සිදු නොවිය යුතුය.' නොඑසේනම්, ඒය කාන්තාරයක මිරිඟුවක් සෙයින් මිථ්‍යාවක් වනු ඇත."

මෙයට අවංක,

තිහාල් ශ්‍රී අමරසේකර

පිටපත් :- ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, පාර්ලිමේන්තුවේ සභා නායක.
ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී, විපක්ෂ නායක.
ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී, විදේශ අමාත්‍ය.

ගරු දේශපාලන පක්ෂ නායකතුමන්ලා

ගරු රාවුෆ් හකීම් ඇමතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී, රාජ්‍ය ගිණුම් කමිටුවේ (PAC) සභාපති.
ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා, ජනාධිපති නීතිඥ, පාර්ලිමේන්තු මන්ත්‍රී, සභාපති, පොදු ව්‍යාපාර පිළිබඳව පාර්ලිමේන්තු කාරක සභාව (COPE)
එස්.සී.මායාදුන්න මහතා, PAC සහ COPE කාර්යාලයේ ව්‍යාපෘති අධ්‍යක්ෂක.

17 වගුව

ග්‍රාමීය විදුලිබල සම්පාදන වැඩසටහන

| පළාත | වැඩසටහන් ගණන |
|---|---|
| දකුණ | 914 |
| උතුරු මැද | 589 |
| මධ්‍යම | 1,143 |
| ඌව | 138 |
| බස්නාහිර | 487 |
| නැගෙනහිර | 407 |
| සබරගමුව | 601 |
| වයඹ | 626 |
| උතුර | 27 |
| **එකතුව** | **4,932** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### කෘෂිකර්මාන්තය සඳහා වැඩි දියුණු කළ වාරිමාර්ග පහසුකම්

කිරිඳිඔය ආශ්‍රිත ජනාවාස සහ කතරගම ප්‍රදේශයේ ජල හිඟයට පිළියම් යෙදීම සඳහා 2006 වසරේ දී ආරම්භ කරන ලද මැණික් ගඟ - වෙහෙරගල වාරිමාර්ග ව්‍යාපෘතියේ වැඩ නිම වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා 2007 වසරේදී රු. මිලියන 556 වැය කර ඇති අතර, 2007 වසරේ සැප්තැම්බර් මස වන විට ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 1,200 කට ආසන්න විය.

මොනරාගල දිස්ත්‍රික්කයේ නව ගොවිපොල ඉඩම් ලෙස අක්කර 1,700 ක් සහ ප්‍රයෝජනයට නොගත් ඉඩම් අක්කර 3,700 ක් වාරිකරණය කිරීම සඳහා රු. මිලියන 798 වියදමකින් සැළසුම් කළ වෙලිඔය වාරිමාර්ග ව්‍යාපෘතිය 2007 ඔක්තෝබර් මස ආරම්භ කරන ලදී. මොරගහකන්ද වාරිමාර්ග ව්‍යාපෘතියේ වැඩ 2007 වසර තුළ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

### සහනදායී ගාස්තු සහිත ජාතික ගුවන් සේවයක්

රු. මිලියන 250 ක රජයේ මූලික ප්‍රාග්ධන දායකත්වයක් සහ තවත් රු. මිලියන 250 ක රජයේ ඇපකර ණය මුදලකින් අරමුදල් සපයමින් පූර්ණ ලෙස රජයේ අනුබද්ධිත සහනදායී ගාස්තු සහිත මිහින් ගුවන් සේවය පිහිටුවන ලදී. නව ගුවන් සේවය ගමනාන්තයන් 7 ක් දක්වා ගුවන් ගමන් ආරම්භ කර ඇත.

### 2006 අංක 47 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය යටතේ ලබාදුන් ප්‍රතිපාදන

අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් යන ව්‍යාපෘති නාමය යටතේ මුද්‍රිත ඇස්තමේන්තු මගින් දක්වා ඇති පරිදි විසර්ජන පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව සංචිත ප්‍රතිපාදන (භාණ්ඩාගාර විවිධ වැය විෂය නමින් හඳුන්වන) මගින් රජයේ අනුමත ව්‍යාපෘති සඳහා මෙන්ම ආයතන මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා අවශ්‍ය අමතර අරමුදල් සැපයීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබේ. සාමාන්‍යයෙන් කල්වේලා ඇතිව හඳුනාගත නොහැකි අවශ්‍යතාවයන් සපුරාලීමට මෙන්ම වාහන මිලදී ගැනීම සඳහා ( කාර්ය මණ්ඩල වාහන මිලදී ගැනීම සඳහා වියදම් ආයතන වෙත ප්‍රතිපාදන වෙන් නොකරන බැවින්) අවශ්‍යවන ප්‍රතිපාදන, ඒ ඒ අමාත්‍යාංශ, විශේෂ වියදම් ඒකක සහ ජේෂ්ඨ ආයතන වෙත පහත සඳහන් පරිදි වෙන් කරනු ලබයි.

1. පුද්ගල පඩිනඩි ගෙවීමේදී ඇති වන හිඟයන් පියවීම
2. අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම
3. වාහන මිලදී ගැනීම්
4. පසුබෑමට ලක්වී ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා ගෙවීම්
5. බදු සහ ගාස්තු ගෙවීම්
6. ආරක්ෂක කටයුතු සම්බන්ධ වියදම්

එසේ වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තරාත්මක ලේඛණයක් පහත වගුවේ දැක්වේ.

වගුව 18

2007-10-15 දින දක්වා ලබා දී ඇති ප්‍රතිපාදන

වියදම් ( රුපියල්)

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | කාරණය | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 01 | අතිගරු ජනාධිපතිතුමා | ආරක්ෂාව හා සම්බන්ධ වියදම් සහ රාජ්‍ය සංචාර, බදු ගෙවීම් සහ ආයතනමය සහායන්, ජනාධිපති කොමිෂන් සභා | 136,401,868 | 423,527,881 |
| 02 | අග්‍රාමාත්‍ය කාර්යාලය | ආරක්ෂාව හා සම්බන්ධ වියදම් | | 40,361,722 |
| 03 | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු | වාහන නඩත්තුව | 2,200,000 | |
| 04 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | විදේශ ගමන් | 542,515 | |
| 05 | පාර්ලිමේන්තුව | පුද්ගල පඩිනඩි, විශ්‍රාමික ප්‍රතිලාභ, දේපල හා වාහන ණය පොලිය | 42,750,000 | 3,662,313 |
| 07 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | කරුණාසහගත දීමනා, වාහන මිලදී ගැනීම | 1,700,000 | 5,500,000 |
| 08 | පාර්ලිමේන්තු විපක්ෂනායකතුමාගේ කාර්යාලය | ආරක්ෂක වාහන අළුත්වැඩියා වියදම් | 1,000,000 | 3,487,000 |
| 09 | හිටපු ජනාධිපතිතුමාගේ කාර්යාලය ( ගරු ඩී.බී.විජේතුංග) | කාර්යාල කුලිය, වාහන මිලදී ගැනීම, පුද්ගල පඩිනඩි | 442,600 | 12,000,000 |
| 10 | හිටපු ජනාධිපතිතුමියගේ කාර්යාලය ( ගරු සී.බී.කුමාරතුංග) | කාර්යාල අවශ්‍යතා | | 1,495,000 |
| 12 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | පුද්ගල පඩිනඩි, විදේශ ගමන් | 1,620,000 | 150,000 |
| 13 | අධිකරණ සේවා කොමිෂන් සභාව | වාහන මිලදී ගැනීම | | 8,500,000 |
| 14 | ජාතික පොලිස් කොමිෂන් සභාව | වාහන මිලදී ගැනීම | | 5,500,000 |
| 16 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | දේශීය ගමන් | 7,040,000 | |
| 17 | මැතිවරණ දෙපාර්තමේන්තුව | විදේශ ගමන්, වාහන මිලදී ගැනීම | 800,000 | 11,565,000 |
| 18 | විගණකාධිපති | දිරිදීමනා ගෙවීම්, වාහන මිලදී ගැනීම | 45,786,000 | 4,250,000 |
| 19 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය | විදේශ ගමන් | 200,000 | |

| | | | | |
|---|---|---|---|---|
| 20 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ජපන් බැංකු ආධාර ලබන එම්.අයි.එස්. ව්‍යාපෘතිය | | 8,325,250 |
| 21 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම | 2,977,458 | 7,500,000 |
| 101 | ආගමික කටයුතු සදාචාර වර්ධන අමාත්‍යාංශය | ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීම, දහම් පාසල් ගුරුවරුන් සඳහා හැකියා වර්ධන ව්‍යාපෘතිය, වාහන මිලදී ගැනීම | 3,610,000 | 105,343,750 |
| 102 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | වසා දමන ලද කර්මාන්ත ශාලා ප්‍රතිව්‍යුහගත කිරීම (ලංකා පුත්‍ර බැංකුව) ,දැයට කිරුළ ප්‍රදර්ශනය, වාහන මිලදී ගැනීම | 6,816,450 | 817,647,610 |
| 103 | රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි , ඉපලෝගම නිවාස ව්‍යාපෘතිය, වාහන මිලදී ගැනීම හා නඩත්තු වියදම් | 7,050,000 | 151,774,600 |
| 104 | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයා | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම, කුලී ගෙවීම් | 7,100,500 | 11,500,000 |
| 105 | ජාතිය ගොඩනැගීමේ වතු යටිතල පහසුකම් හා සංවර්ධන අමාත්‍යාංශය | උතුරු නැගෙනහිර නිවාස නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය. යාපනයේ ජල සංරක්ෂණ සහ පරිසර ව්‍යාපෘතිය, වාහන මිලදී ගැනීම. හිඟ වැටුප් ගොඩනැගිලි නඩත්තුව | 221,000,000 | 381,830,000 |
| 106 | ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය | සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා දායකත්ව මුදල් | 2,929,392 | 4,005,328 |
| 107 | සංචාරක අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම, යුනිසෙෆ් ප්‍රදාන | 3,222,000 | 31,132,800 |
| 108 | තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය | වාහන, යන්ත්‍ර සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 150,000 | 35,865,000 |
| 110 | අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | වාහන, ලීබඩු සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම, පුද්ගල පඩිනඩි | 26,500,000 | 169,926,000 |
| 111 | සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, වාහන හා යන්ත්‍රසූත්‍ර මිලට ගැනීම සහ අළුත්වැඩියා කිරීම, පුහුණුවීම් හා හැකියා වර්ධනය | 365,080,000 | 18,933,789 |
| 112 | විදේශ කටයුතු අමාත්‍යාංශය | ඇත්පැටවකු චීනයට ප්‍රවාහනය කිරීම, වාහන මිලදී ගැනීම | 20,824,550 | 6,000,000 |
| 113 | වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | "මිහින් ලංකා" සඳහා ප්‍රාග්ධන දායකත්වය | | 250,000,000 |
| 114 | ප්‍රවාහන අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම, හිඟ වගකීම් පියවීම, සුනාමියෙන් විනාශ වූ ප්‍රදේශවල ප්‍රවාහනය නංවාලීමේ ශාක්‍යතා අධ්‍යයනය | 1,500,000 | 160,575,000 |
| 115 | ඛණිජ තෙල් හා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | මෙහෙයුම් වියදම්, වාහන මිලදී ගැනීම | 21,571,000 | 17,330,000 |

| | | | | |
|---|---|---|---|---|
| 116 | වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම, සතොස සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාවලිය | 3,200,000 | 339,336,063 |
| 117 | මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම, මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම | 7,300,000 | 1,103,180,000 |
| 118 | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, වාහන, වලවේ වම් ඉවුර ව්‍යාපෘතිය, වෙනත් ආයෝජන | 21,171,660 | 501,444,482 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය | UNFP සහ යුනිසෙෆ් ව්‍යාපෘති සඳහා පුද්ගල පඩිනඩි | 5,000,000 | 10,375,802 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ජංගම සේවා, සුනාමි කටයුතු සඳහා GTZ වැඩසටහන | 16,784,860 | 13,428,632 |
| 122 | ජන මාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම, පුද්ගල පඩිනඩි, ගොඩනැගිලි පුනරුත්ථාපනය | 6,908,000 | 48,260,000 |
| 123 | නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම, ඉඩම් අත්පත් කර ගැනීම, කුලී සහ විදේශ සංචාර | 3,507,000 | 51,955,000 |
| 124 | සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, සමාජ සුරැකුම් මධ්‍යස්ථාන සහ ක්ෂේත්‍ර ඉගැනුම් මධ්‍යස්ථානයන්හි ආයෝජන | 3,171,455 | 11,478,318 |
| 125 | නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම, ඉංජිනේරු සේවා | | 18,500,000 |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම, යුනිසෙෆ් සහ NFPA ප්‍රදාන | 8,650,000 | 64,055,324 |
| 127 | කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම | 10,240,000 | 16,730,000 |
| 128 | ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, කුලී ගාස්තු | 6,305,794 | 4,457,298 |
| 129 | වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය | මෙහෙයුම් වියදම්, බදු සහ රේගු බදු ගෙවීම, වාහන මිලදී ගැනීම | 30,260,000 | 97,200,000 |
| 130 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් | 6,012,000 | 18,915,098 |
| 132 | ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් ණයදීම් (ණය ආධාර වැඩසටහන) | 40,984,000 | 69,584,000 |
| 133 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා | කුලී, වරිපනම් සහ බදු, නැනෝ තාක්ෂණ මධ්‍යස්ථානය, වාහන මිලදී ගැනීම. | 39,600,000 | 85,200,000 |
| 134 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම | | 13,500,000 |
| 135 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | වාහන සහ උපකරණ මිලදී ගැනීම, නැවත වගා කිරීමේ ව්‍යාපෘතිය, වාහන මිලදී ගැනීම, ප්‍රතිව්‍යුහගතකරණය | 6,600,000 | 420,676,516 |

| | | | | |
|---|---|---|---|---|
| 136 | ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම | | 13,000,000 |
| 138 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම, පුද්ගල පඩිනඩි | 2,489,246 | 15,000,000 |
| 139 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම්, ධීවරයින් සඳහා භූමිතෙල් සහනාධාරය, සුනාමියෙන් විනාශ වූ ධීවර බෝට්ටු පුනරුත්ථාපනය | 7,225,000 | 125,614,878 |
| 140 | පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | මෙහෙයුම් හා ප්‍රාග්ධන වියදම් | 10,681,000 | 23,433,000 |
| 142 | සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම, ප්‍රතිව්‍යුහගත කටයුතු ශ්‍රී ලංකා නෙදර්ලන්ත සංස්කෘතික සහයෝගිතා ද්වි සටහන | 4,960,000 | 118,500,000 |
| 143 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | වාහන, කරුණා සහගත දීමනා, කුලී ගෙවීම් | 7,100,000 | 21,000,000 |
| 149 | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | ප්‍රතිව්‍යුහගතකරණය, වාහන මිලදී ගැනීම | | 42,832,356 |
| 151 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධක අමාත්‍යාංශය | ගොඩනැගිලි අළුත්වැඩියාව සහ වැඩිදියුණුව | | 10,748,624 |
| 152 | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය | මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් | 26,229,406 | 41,497,733 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් | 10,550,676 | 20,043,500 |
| 155 | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය (මාතලේ සහ දකුණු පළාත) දක්ෂිණ සංවර්ධන අධිකාරිය | | 165,000,000 |
| 156 | තරුණ කටයුතු අමාත්‍යාංශය | ණය නිරවුල් කිරීම | | 31,000,000 |
| 160 | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම, ප්‍රාදේශීයව ඇති විය හැකි හදිසි අවස්ථාවන් සඳහා සූදානම්වීම සහ දැනුවත්වීමේ වැඩ සටහන. | 27,000,000 | 19,973,655 |
| 161 | අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශය | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | 1,000,000 |
| 164 | ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශය | වාහන | | 34,450,000 |
| 165 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, කුලී සහ පළාත් පාලන ආයතනවලට බදු | 10,832,000 | |
| 166 | ජලසම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය | වාහන, පුනරුත්ථාපන, නැවත ඉදිකිරීමේ හා නැවත පදිංචි කිරීමේ වැඩ සටහන, ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන. | | 52,900,000 |

| | | | | |
|---|---|---|---|---|
| 167 | අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය | විදේශ ගමන් | 5,000,000 | |
| 169 | ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශය | වාහන මිලදීගැනීම | | 7,000,000 |
| 170 | විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය | කාර්යාල කුලීය, වාහන මිලදී ගැනීම | 19,451,000 | 18,500,000 |
| 171 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | වාහන මිලදී ගැනීම | | 7,800,000 |
| 172 | අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය | පුද්ගල පඩිනඩි, ප්‍රතිව්‍යුහගතකරණය | | 4,550,000 |
| 202 | මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | බදු සහ රේගු ගාස්තු | 2,000,000 | |
| 209 | ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව | මධ්‍යම සංස්කෘතික අරමුදල, (TANA ව්‍යාපෘතිය) | | 1,500,000 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, කුලී සහ බදු , 2007 සංවර්ධන සමුළුව | 10,188,255 | |
| 211 | රජයේ මුද්‍රණාලයාලය | වාහන, හැකියා වර්ධනය | 50,181 | 11,500,000 |
| 212 | විභාග දෙපාර්තමේන්තුව | වාහන පුද්ගල පඩිනඩි | 2,689,000 | 6,000,000 |
| 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | දේපළ ණය පොලිය | 150,000 | |
| 214 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | පරිපාලන නොවන, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දීමනා | 155,000,000 | |
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේනතුව | වාහන | | 3,500,000 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | යන්ත්‍ර | | 341,164 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, වාහන මිලදි ගැනීම | 8,823,859 | 3,500,000 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 4,122,000 | |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 63,766,770 | |
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ, ළමා ශ්‍රමය ලබාගැනීම වැළැක්වීමේ වැඩසටහන, උතුරු නැගෙනහිර මාර්ගෝපදේශ සහ උපදේශන වැඩසටහන | | 18,448,500 |
| 222 | ශ්‍රී ලංකා යුද හමුදාව | වාහන, විදේශ ගමන්, හයිටිහි ශ්‍රී ලංකා හමුදා බල ඇණි සඳහා | 18,480,168 | 101,519,832 |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | වන්දි ගෙවීම | 240,000 | |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | | 200,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | 2007 සංවර්ධන සමුළුව - ආරක්ෂක වියදම් | 325,000 | |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, ගොඩනැගිලි පුනරුත්ථාපනය | 5,000,000 | 1,500,000 |
| 228 | අධිකරණ පරිපාලනය | පුද්ගල පඩිනඩි, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ අත්පත් කර ගැනීම, වාහන බදු ගැනීම | 1,300,000 | 109,000,000 |
| 229 | නීතිපති දෙපාර්තමේන්තුව | වාහන සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම, විදේශ ගමන්, වාහන රක්ෂණය කිරීම | 4,112,971 | 100,800,000 |
| 230 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | වාහන | 417,000 | 14,500,000 |
| 231 | ණය සහනදායක මණ්ඩලිය දෙපාර්තමේන්තුව | ගිවිසුම්ගත සේවා | 124,000 | 131,046 |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | වාහන | | 16,000,000 |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | වාහන | | 10,000,000 |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | දේශීය ගමන්, වාහන මිලදී ගැනීම | 75,000 | 187,000,000 |
| 235 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | වාහන | | 1,500,000 |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | පුහුණුවීම් හා හැකියා වර්ධනය | | 3,500,000 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, විදේශ ගමන් | 600,000 | 105,500,000 |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | වාහන | | 11,400,000 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 2007 සංවර්ධන සමුළුව, නේවාසික කාර්යාල සඳහා බදු ප්‍රතිපූර්ණය | 10,889,650 | 1,500,000 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | වාහන | | 3,800,000 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා මහබැංකුව වෙත ගෙවිය යුතු දඩ මුදල සඳහා මහජන බැංකුවට ප්‍රතිපූර්ණය කිරීම, වාහන මිලදී ගැනීම | 920,000 | 314,319,494 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | වාහන | | 2,800,000 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සඳහා මෙහෙයුම් හා ප්‍රාග්ධන අවශ්‍යතා | 15,400,000 | 12,800,000 |
| 244 | වෙළඳ තීරුබදු සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | වාහන | 450,000 | 8,400,000 |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | වාහන සහ ගොඩනැගිලි | | 88,115,000 |

| | | | | |
|---|---|---|---|---|
| 247 | ශ්‍රී ලංකා රේගුව | රේගු තැගි දීමනා ක්‍රමය, වාහන, රේගු මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම | 71,736,365 | 158,130,000 |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව | වාහන | 300,000 | 31,243,000 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | වාහන | | 13,618,000 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | වාහන | | 6,600,000 |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | වාහන, දේපල ණය පොලී | 2,600,000 | 8,000,000 |
| 252 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | වාහන, නැගෙනහිර පළාත් විශේෂ සංගණනය, පුද්ගල පඩිනඩි | 10,816,173 | 57,000,000 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | වාහන | | 10,000,000 |
| 255 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ | පුද්ගල පඩිනඩි | 24,500,000 | |
| 258 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | පුද්ගල පඩිනඩි | 25,000,000 | |
| 259 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | පුද්ගල පඩිනඩි, වී මිලදී ගැනීම | 9,833,332 | |
| 260 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය | පුද්ගල පඩිනඩි | 3,449,000 | |
| 261 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | පුද්ගල පඩිනඩි | 25,500,000 | |
| 262 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | පුද්ගල පඩිනඩි, සුනාමි තාවකාලික මධ්‍යස්ථානවල ජල සහ විදුලි බිල්පත් ගෙවීම | 29,125,888 | |
| 263 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට | පුද්ගල පඩිනඩි | 19,727,000 | |
| 264 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - යාපනය | පුද්ගල පඩිනඩි, යුනිසෙෆ් වැඩසටහන | 11,500,000 | 14,849,230 |
| 265 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මන්නාරම | වී මිලදී ගැනීම, යුන්සෙෆ් වැඩසටහන | 2,584,314 | 1,019,580 |
| 266 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - වවුනියාව | දේපළ ණය පොලී, යුනිසෙෆ් වැඩසටහන | 700,000 | 237,500 |
| 267 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මුලතිව් | උප්පැන්න සහතික වැඩසටහන (යුනිසෙෆ්) | | 400,350 |
| 268 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - කිලිනොච්චි | පුද්ගල පඩිනඩි | 1,950,000 | |
| 269 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව | පුද්ගල පඩිනඩි, දේපල ණය පොලිය, යුනිසෙෆ් වැඩසටහන | 9,870,622 | 331,500 |

| | | | | |
|---|---|---|---|---|
| 270 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | පුද්ගල පඩිනඩි | 16,000,000 | |
| 271 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - ත්‍රිකුණාමලය | යුනිසෙෆ් වැඩසටහන | | 1,007,000 |
| 273 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම | පුද්ගල පඩිනඩි | 13,000,000 | |
| 274 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය | පුද්ගල පඩිනඩි, යුනිසෙෆ් වැඩසටහන | 12,800,000 | 304,500 |
| 275 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව | වී මිලදී ගැනීම, වාහන අළුත්වැඩියා කිරීම | 1,180,144 | 770,000 |
| 278 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | පුද්ගල පඩිනඩි, පුහුණු කිරීම සහ හැකියා වර්ධනය | 1,956,000 | 100,000 |
| 279 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | පුද්ගල පඩිනඩි | 15,540,000 | |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, විදේශ ගමන් | 122,300,000 | |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 35,600,000 | |
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 24,623,168 | |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 9,000,000 | |
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සුළු පරිමාණ කෘෂිකර්මාන්ත පරික්ෂණ ව්‍යාපෘතිය, පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම | 44,017,574 | 20,300,000 |
| 288 | මැනුම් දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, වාහන මිලදී ගැනීම | 34,777,773 | 11,400,000 |
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 5,694,900 | |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාරත්මේන්තුව | කිමිදුම් උපකරණ මිලදී ගැනීම | | 629,013 |
| 291 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 8,000,000 | |
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | වාහන | | 5,900,000 |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | වාහන | | 3,500,000 |
| 296 | ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව | විදේශ ගමන් ,වාහන මිලදී ගැනීම | 500,000 | 4,600,000 |
| 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 1,490,000 | |
| 298 | මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සහ රසායනාගාර ඉදිකිරීම | | 1,213,250 |
| 303 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි, කුලී | 2,800,000 | |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | ජී.පී.එස්. කේපබල් ව්‍යාපෘතිය | | 453,600 |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | ගිලන් රථයක් මිලදී ගැනීම, වන්දි ගෙවීම | 11,374,500 | 6,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | ආරක්ෂක සේවා | 3,000,000 | |
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 350,000,000 | |
| 311 | ජාතික හෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි | 17,500,000 | |
| 312 | බස්නාහිර පළාත් සභාව | අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය - කළුතර | | 1,000,000 |
| 313 | මධ්‍යම පළාත් සභාව | වාහන මිලදී ගැනීම, යුනිසෙෆ් වැඩසටහන | | 26,928,457 |
| 314 | දකුණු පළාත් සභාව | ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, යුනිසෙෆ් වැඩසටහන | | 51,346,237 |
| 315 | උතුරු පළාත් සභාව | යුනිසෙෆ් වැඩසටහන, උතුරු/නැගෙනහිර සමාජ සංවර්ධන සහ සංරක්ෂණ ව්‍යාපෘතිය | | 149,448,848 |
| 316 | වයඹ පළාත් සභාව | යුනිසෙෆ් වැඩසටහන | | 14,230,505 |
| 317 | උතුරු මැද පළාත් සභාව | යුනිසෙෆ් වැඩසටහන | | 15,725,182 |
| 318 | ඌව පළාත් සභාව | යුනිසෙෆ් වැඩසටහන | | 93,347,040 |
| 319 | සබරගමුව පළාත් සභාව | වාහන මිලදී ගැනීම | | 7,500,000 |
| 321 | නැගෙනහිර පළාත් සභාව | යුනිසෙෆ් වැඩසටහන, උතුරු / නැ. සමාජ සංවර්ධන සහ සංරක්ෂණ ව්‍යාපෘතිය | | 78,707,633 |
| | | | **2,563,498,037** | **8,494,523,783** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව